# හේතුඵල න්‍යාය තුළ ආහාරයේ චක්‍රීයත්වය පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය, කහගල්ලේ ශාන්ත හිමි[1]

**හැඳින්වීම**

**"සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා"** යන මූලික බුද්ධපාඨය අද්‍යතනය තුළ අර්ථවිග්‍රහ කරනුයේ සියලු සත්ත්වයාගේ ජීවය ඕජාව සහිත වූ කබලීකාර ආහාරය මත යැපෙන බව යි. බුද්ධභාෂිතය තුළ මෙම පාඨය අවධාරණය වනුයේ එකී ලඝු අර්ථයකින් නො ව පුළුල් අර්ථ සහිත දාර්ශනික පසුබිමකිනි. ඒ පිළිබඳවත් ආහාර මාර්ගයෙන් සසර ප්‍රවෘත්තිය නිර්මාණයත් මෙම ලිපියේ දී අධ්‍යයනය කෙරේ.

**පර්යේෂණ අරමුණ**

බුදුසමයේ අන්තර්ගත ආහාර සඞ්කල්පයේ දාර්ශනික පසුබිම පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මූලාශ්‍රය අධ්‍යයනයක් තුළින් දත්ත රැස්කර ගන්නා අතර, එහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ත්‍රිපිටකය ද මේ හා සම්බන්ධ දැනට ලියවී ඇති කෘති හා ශාස්ත්‍රීය ලිපි ද්විතීයික  මූලාශ්‍රය වශයෙන් ද භාවිත කෙරේ.

**පර්යේෂණ ගැටලුව**

සංසාර ප්‍රවෘත්තිය තුළ ආහාරය සකස් වන්නේ කෙසේ ද?

**පර්යේෂණ සාකච්ඡාව**

**"සබ්බෙ සත්තා ආහාරටඨිතිකා"** (ඛුද්දකනිකාය, කුමාරපඤ්හ. 4පිට) යන උද්ධෘතයට අනුව ලොව සියල්ලක ම පැවැත්ම ආහාරය මතය පිහිටි බව අවධාරිත ය. ජීවියෙකුගේ පැවැත්ම ලෙස ව්‍යවහාර ලෝකයේ දී සලකනු ලබන්නේ අපවෘතිය සහ සංවෘතිය නම් වූ සමාන්තර ක්‍රියාවලිය යි. නමුත් බුදුසමයේ ඉන් ඔබ්බට ගොස් පටිච්චසමුප්පන්න න්‍යාය තුළ ආහාරය තුළින්  සත්ත්වයාගේ පැවැත්ම නිර්මාණය වන අයුරු පිළිබඳ දාර්ශනික ආකල්පයක් ඉදිරිපත් කරයි. මෙහි දී විශේෂයෙන් අවධාරණය කරගත යුත්තේ 'ආහාර' යන වචනයේ අර්ථය කුමක්ද යන්න යි. **"ආහරතීති ආහාරො"** ඵලයක් ගෙන එන නිසා ආහාර යැයි අදහස් කෙරේ. 'ආ' පූර්ව 'හර (හරණාර්ථ)' ධාතුවෙන් නිපන් ආහාර යන පදය 'ප්‍රත්‍යය' යන්නට පර්යාය පදයකි. සංයුත්තනිකායේ නිදානසංයුත්තයට අයත් ආහාර සූත්‍රයට අනුව සත්ත්වයාගේ පැවැත්මට අනුග්‍රහ පිණිස වන ආහාරයෝ සතර දෙනෙකි. 1. කබලීකාරාහාර, 2. ඵස්සාහාර, 3. මනෝසංචේතනාහාර, 4.විඤ්ඤාණාහාර වශයෙනි. මෙහි දී කබලීකාර ආහාරය වශයෙන් **"ඕජට්ඨමකං රූපකලාපං ආහාරතී'ති ආහාරො"** (සාරත්ථදීපනීටීකා, chaṭṭhasaṅgāyanā CD.1999) ආහාර ඕජාව අටවෙනි කොට ඇති රූපකලාප සකස් වෙන බැවින් ආහාර ලෙස හඳුන්වයි. 'කබළ' යනු පිඬුවට නමකි. බත් ආදී ආහාර පිඬු කොට අනුභව කරන බැවින් ඒවා කබලීකාර ආහාර නම් වේ. එය සාමාන්‍ය

[1]. *kshanthass1018@gmail.com*

ව්‍යවහාරයේ දී බත්, ධාන්‍ය, පලතුරු සේ ම කිරි වැනි දියරමය ආහාර වශයෙන් හඳුනා ගනී. කබළීකාර ආහාර ඕළාරික හෝ සූක්ෂ්ම විය හැකි ය. අග්ගඤ්ඤ සූත්‍රය තුළ දී ආභස්සර දෙව්ලොව සිට පැමිණි සත්‍වයා පෘථුවි තලයට පැමිණ දිව්‍යමය ජීවිතයෙන් පිරිහීම දක්වා ආහාර රටාවේ පරිණාමය දක්වයි. ඕළාරික හෝ සූක්ෂ්මභාවය තීරණය වනුයේ ආහාරයේ ඇති ඕජාව අනුව ය. කබළීකාර ආහාරය සිදු කරන කෘත්‍ය නම් පීඩා දුරු කිරීම හා ශරීරය පාලනය කිරීම යි. ඒ සඳහා කබළීකාර ආහාරය මුවින් විකා ගිලීම හෝ ඇඟ ගැල්වීම හෝ අන් ක්‍රමයකින් ශරීරගත කළ යුතු ය. මව්කුස තුළ පිළිසිඳි කලලය පවා මවගේ මාර්ගයෙන් කබළීකාර ආහාර ඕජාව ලබයි. ධම්මපාල හිමියන් අටුවාව තුළ විග්‍රහ කරනුයේ අසිත - අනුභව කරන දෑ, පීත - බොන දෑ, ඛායිත - උරන දෑ, සායිත - රස විඳින දෑ  කබළීකාර ආහාර ලෙස යි (පෙතවත්‍ථු අටුවා P.T.S 25 පිට). දෙතිස් කුණපයන්ගෙන් සැදුම්ලත් මෙම ශරීරය පවත්වාගෙන යනු ලබන්නේ මෙකී කබළීකාර ආහාරයෙනි. එම ආහාරය අනාත්ම ලක්ෂණයෙන් යුක්ත ය. අනාත්ම වූ ඒ ආහාරය හේතුවෙන් සකස් වන ඵලය නම් රූපය යි. රූපය මම ය, මාගේ ය වශයෙන් ආත්මගත වුව ද එය පවතින්නේ කබළීකාර ආහාරය මත යි. නැතහොත් ක්ෂය වී යයි. රූපය ආහාරයෙන් සකස් වූ ආහාරයේ ම තවත් පැත්තක් මිස මම හෝ මගේ යන ආත්මදෘෂ්ටියෙන් ගත නො හැකි ය. සිංහයකු මිනිසෙකුගේ අත්, පා කඩාගෙන කෑ විට එය සිංහයාගේ ශරීරය ශක්තිමත් කරනට වර්ධනය වීමට මෙන් ම සම්,  මස්, ලේ, නහර වැඩීමට ප්‍රත්‍ය වේ. මනුෂ්‍යයෙකු විසින් මුවෙකු, ඌරෙකු ආහාරයට ගැනීම ද එලෙස ම ය. පුද්ගල ආත්ම වශයෙන් ගත් ශරීරය සාපේක්ෂක ව තවකෙකුට කබළීකාර ආහාරයකි. එබැවින් සතර මහා ධාතුන්ගෙන් හා වර්ණ, ගන්ධ,  රස, ඕජා යන ශුද්ධාෂ්ටක සමවායයෙන් නිපන් රූපකලාපය ද ආහාරයකි. ශුද්ධාෂ්ටක නම් වූ බාහිර ආහාරයෙන් ගොඩ නැඟෙන අභ්‍යන්තර ආහාරය (ආධ්‍යාත්මික සවිඥානික රූපය) කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර යන්න යි. රූපයේ පහළවීම යනු පුද්ගලයාට ලෙඩ-දුක්, මැසි-මදුරු, අව්-වැසි පීඩා විඳීමට සිදු වන දුකෙහි ආරම්භය යි. එබැවින් කබළීකාර ආහාරය නිසා උපන් රූපය පිනවීමට නො ව අවබෝධය පිණිස පවතින්නක් යන සංඥාව ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා උපදවා ගනී. සවිඥානක රූප පිළිබඳ පවතින මෙකී ධර්මතාව තේරුම් ගත් හෙතෙම නුවණින් දිවිපැවැත්මට උපකාර පිණිස පමණක් කබළීකාර ආහාරයේ ප්‍රතිඵල බලපොරොත්තු වේ. පුත්තමංස සූත්‍රයට අනුව (සංයුත්තනිකාය 2, බු.ජ.මු. 154 පිට) කාන්තාරයක තම පුතු සමග ඇවිද යන මව සහ පියා මාර්ගෝපකරණ හිස් වීමෙන් තම පුතු මරා මස් අනුභව කරනුයේ මාංසරස තෘෂ්ණාවෙන් නො ව ඉතිරි කතරමඟ ඇවිද යාමට ය. තදනන්තර ව විස්තර වනුයේ ඵස්සාහාරය යි. මෙය චෛතසිකධර්මයකි. ඉන්ද්‍රිය හා අරමුණු ගැටීමෙන් ඊට අදාළ විඤ්ඤාණය පහළවීමත් සමග ස්පර්ශය හටගනී. 'චක්ඛු', 'සොත', 'ඝාණ', 'ජිව්හා', 'කාය', 'මන' වශයෙන් ස්පර්ශ ආයතන හයකි (අභිධර්මාර්ථප්‍රදීපිකා, පළමු කාණ්ඩය. 619 පිට). මෙහි දී ඇත්තේ උපගමන බිය යි. ශරීරයේ හම නැති එළදෙනකු ගසත් පොළවත් හිස් අවකාශයත් ඇසුරු කර සිටිය ද අන් සත්‍වයන්ගේ උපද්‍රවයන්ට ගොදුරු වේ. එලෙස ම ඵස්සාහාරය නිසා හටගන්නා ත්‍රිවිධ වේදනා මැනවින් දත යුතු ය. චක්ඛුසම්ඵස්සයෙන් ඉපදුනු රූපය දුක්සහගත වූවක් නම් දුක්සහගත රූප ස්පර්ශය දුකක් ම ය. එය උපේක්ෂාසහගත නම් උපේක්ෂාසහගත ස්පර්ශය ද විපරිණාම වේ. එවිට එය ද දුකක් ම ය. විපරිණාමය නො වන සැපතක් නැත්තේම ය. එය ද දුකක් ම ය. මනසෙහි ඇති රළු ස්වභාවය නිසා විපරිණාමය වීම අවබෝධ නො

වුවත් විදර්ශනා ඥානය තුළ සියලු ස්පර්ශයන් ම දුකක් බවට ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙමේ හඳුනා ගනී. තුන්වෙනි ආහාරය ලෙස මනෝසංචේතනා ආහාරය විග්‍රහ වේ. ස්පර්ශ ආයතන හයට ගෝචර වන අරමුණු ඔස්සේ මනස මෙහෙයවීම මෙහි දී අදහස් කෙරේ. ඒ තුළ ගොඩනැඟෙන ඵලය නම් කාම, භව, විභව යන ත්‍රිවිධ තෘෂ්ණාව යි. තෘෂ්ණාව ඇති කරවීම චේතනාවේ ලක්‍ෂණය යි. තෘෂ්ණාව උපකාරයෙන් 'කාම', 'රූප', 'අරූප' යන ත්‍රිවිධ භවය සකස් කෙරේ. එබැවින් මෙම ත්‍රිවිධ භවය නමැති ඵලය ගෙන දෙන නිසා මනෝසංචේතනාව ආහාරයක් ලෙස හඳුන්වයි. ප්‍රමාණයෙන් පුද්ගල ප්‍රමාණය ඉක්ම වූ ගිනිසිළුවෙන් හා දුමෙන් තොර අඟුරුවළකට බලවත් පුරුෂයන් දෙදෙනකු ජීවත්වනු කැමති, සුවයට කැමති පුරුෂයෙකුගේ දෑතින් අල්වාගෙන අදින කල්හි එකී පුරුෂයාගේ සිතිවිල්ල කෙතරම් දුරස් වන්නේ ද එලෙස ම මනෝසංචේතනාව බැහැර කළ යුතු බව පෙළෙහි දැක්වේ. සිව්වැනි ප්‍රත්‍ය නැතහොත් ආහාරය විඤ්ඤාණ ආහාරය යි. විඤ්ඤාණය නමැති ආහාරය ප්‍රත්‍ය නිසා හට ගන්නා ඵලය නැවත නාමරූප දෙකෙහි ප්‍රතිසන්ධිය යි. දවස පුරා ගුටි කන හොරෙකු දුක්දොම්නස් විඳීම ඒකාන්තයක් මෙන් ම කර්ම විඥානය පැවතියහොත් ප්‍රතිසන්ධි වශයෙන් මේ විඤ්ඤාණය මව්කුසට බැස ගැනීම අනිවාර්ය වේ. සමස්තයක් ලෙස ගත් විට ඉහත කී චතුර්විධ ආහාර සඞ්කල්පය දිග හැරෙනුයේ අනුභවය නම් ලඝු සීමාවක සිට නො ව දාර්ශනික සඞ්කල්පනාවකිනි. සාමාන්‍ය ව්‍යවහාරයේ දී ආහාරය පැවැත්ම නියෝජනය වුව ද බෞද්ධ දෘෂ්ටිකෝණය තුළ නැවැත්ම නිරූපණය කරයි. මානසික ආහාර ත්‍රිත්වයක් හඳුන්වා දී තිබීමෙන් එහි දාර්ශනික අගය වැඩි වී තිබේ. කබළීකාර ආහාරය විෂයෙහි සිදු කළ යුත්තේ එහි ඇති තෘෂ්ණාව දුරු කිරීම පමණි. එය ප්‍රතික්‍ෂේප කිරීමක් අවශ්‍ය නැත. ජීවය රඳවා ගැනීම පමණක් අරමුණු කළ යුතු ය. මානසික ආහාර විෂයෙහි මනාව අවබෝධය සේ ම ඇලීම ප්‍රහාණය කළ යුතු ය. සත්ත්වයාගේ නාමකායේ හා රූපකායෙහි ඉපැත්මට හා පැවැත්මට ප්‍රත්‍යභාවයෙන් හේතුභූත වනුයේ ආහාරය යි. මේ සියලු ආහාර පිළිබඳ ව ඥාතපරිඥාවෙන් තීරණපරිඥාවෙන් ප්‍රහාණපරිඥාවෙන් දත යුතු ය. කබළීකාර ආහාරය නිසා රූපය ගොඩනැඟේ. රූප කලාපය හේතුකොටගෙන සළායතන නිෂ්පන්න වේ. ස්පර්ශාහාරය නිසා වේදනා, සංඥා ගොඩනැඟෙන අතර, වේදනා, සංඥා නිසා මනෝසංචේතනාව වේ. මනෝසංචේතනාව ප්‍රත්‍ය කොට ත්‍රිවිධ භවය සකස්වන අතර, ත්‍රිවිධ භවය ප්‍රත්‍ය වී ප්‍රතිසන්ධි විඥානය ගොඩනැඟේ. විඥානය හේතුකොට නාමරූප පහළ වේ. නාමරූප සකස් වූ පසු නැවත කබළීකාර ආහාරය අවශ්‍ය වේ. විඥානය කබළීකාර ආහාරයට ආහාරයක් වේ. මෙලෙස චක්‍රීය ව පටිච්චසමුප්පන්න ව ආහාරය ගලායෑම යෝගාවචරයා නුවණින් දැකිය යුතු ය.

**පර්යේෂණ නිගමනය**

සසරට අයත් සියලු ධර්මයක් ම ප්‍රත්‍යකි. පටිච්චසමුප්පාදය අරබයා ආහාරයෙහි සන්ධීය ස්වභාවයක් ප්‍රකට කෙරේ. ඒ අනුව අතීතයට යොමු කොට භවගමන විමසූ විට ඒ නයින් අනාගත සංසාර ප්‍රවෘත්තිය ගොඩනැඟෙනුයේ චක්‍රීය ව බව පැහැදිලි වේ.

**ප්‍රමුඛ පදඃ** කබළීකාරාහාරය, ඵස්සාහාරය, මනෝසංචේතනාහාරය, විඤ්ඤාණාහාරය.

## මූලාශ්‍රය


- **සංයුත්තනිකාය 2.** (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **ඛුද්දකනිකාය** 1. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- රත්නපාල, අමරදාස (1964). **අභිධර්මාර්ථ ප්‍රදීපිකා පළමු කාණ්ඩය.** කොළඹ: ඇම් ඩී ගුණසේන සහ සමාගම.
- ධම්මරතන ස්ථවිර, කඹුරුපිටියේ (1847). **විසුද්ධිමාර්ග සන්නය.** කොළඹ: මහාබෝධි මුද්‍රණාලය.
- සිරි සුමඞ්ගල හිමි, මඩිතියවෙල (1965). **පාලි සිංහල ශබ්දකෝෂය.** කොළඹ: ඇම්.ඩී ගුණසේන සහ සමාගම.
- **Chaṭṭthasaṅgāyanā CD.** (1999). Dammagiri: Vipassana Research Institute.